# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2200/2 - 2020 නොවැම්බර් මස 02 වැනි සඳුදා - 2020.11.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

මගේ අංකය : 01/10/03/04.

**ඌව පළාතේ පළාත් සභාව**

ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම්

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(1) උපවගන්තිය යටතේ ඌව පළාත් ආණ්ඩුකාරවර ඒ. ජේ. එම්. මුසම්මිල් වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත සඳහන් පත් කිරීම් සිදු කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II ශ්‍රේණියේ නිලධාරි එම්. ටී. ජී. ඒ. එන්. ලක්මාල් මහතා 2020.09.07 දින සිට ක්‍රියාත්මක වන පරිදි වසරක කාලයක් සඳහා ඌව පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට.

02. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ III ශ්‍රේණියේ නිලධාරිණී එල්. එච්. පී. නිල්මිණී මහත්මිය, තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව වහාම ක්‍රියාත්මක වන පරිදි (2020.09.15 දින සිට) බදුල්ල දිස්ත්‍රික් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාප්ති) තනතුරේ වැඩ බැලීමට.

03. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි ජී. ජී. එන්. ගුණරත්න මහතා, වහාම ක්‍රියාත්මකවන පරිදි (2020.09.21 දින සිට) ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම් වශයෙන්.

04. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ විශ්‍රාමික නිලධාරිණී ජී. ඒ. එම්. එස්. පී. අඹන්වල මහත්මිය, ඌව පළාතේ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන (ද්‍රවිඩ පාසැල් හැර), පළාත් පාලන, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් හා ඉඩම් පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම යටතේ 2020.10.09 වන දින සිට 2021.10.08 වන දින දක්වා කොන්ත්‍රාත් සේවා කාලය දීර්ඝ කිරීමට.

05. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරි ඩී. එම්. රත්නායක මහතා, වහාම ක්‍රියාත්මකවන පරිදි (2020.10.06 වන දින සිට) ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට.


1A - PG 5207 — 45 (2020/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

06. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිණී ආර්. එම්. එස්. ඩී. රත්නායක මහත්මිය, වහාම ක්‍රියාත්මකවන පරිදි (2020.10.15 දින සිට) ඌව පළාත් නිවාස කොමසාරිස් තනතුරේ වැඩ බැලීමට.

07. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරි සී. අද්දරවත්ත මහතා, 2020.08.25 දින සිට ක්‍රියාත්මකවන පරිදි තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව ඌව පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ට්‍රාර් තනතුරේ රාජකාරි ඉටුකිරීමට.

**ඒ. ජේ. එම්. මුසම්මිල්,**
ඌව පළාත් ආණ්ඩුකාරවර.

2020 ඔක්තෝබර් මස 29 වැනි දින,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.